2007 සැප්තැම්බර් 05

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක: 5/2007

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් ,

**<u>මූල්‍ය කළමනාකරණයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ලඟා කර ගැනීම සඳහා රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙනුවෙන් නව බැංකු ගිණුම් ජාලයක් හඳුන්වාදීම.</u>**

සමහර රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මුදල් අවශ්‍යතාවයෙන් දැඩිව පෙලෙන අතර තුර තවත් සමහර රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සිය බැංකු ගිණුම් වල ශේෂ, එකතුව වශයෙන් ගත් කල භාවිත නොවන මුදල් ශේෂ වශයෙන් විශාල මුදලක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වී ඇත. මෙම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහාත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහාත්, ලංකා බැංකුව සහ මහජන බැංකුවේ සහයෝගීතාවයෙන් මධ්‍යගතව පාලනය කෙරෙන කේවල බැංකු ගිණුම් ක්‍රමයකින් යුතු යාන්ත්‍රණයක් පවත්වාගෙන යාමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත. මෙය වර්තමානයේ එම බැංකු දෙකෙහි පවතින තොරතුරු තාක්ෂණ හා ජාල පහසුකම් ප්‍රයෝජනයට ගනිමින් ක්‍රියාත්මක කරනු ඇත.

**නව ක්‍රමයේ අරමුණු**

I බැංකු දෙකෙහි පවතින මාර්ග ගත (ON LINE) පහසුකම් උපයෝගි කර ගනිමින් රජයට ලැබෙන ආදායම් ක්ෂණිකව එක්රැස් කර ගැනීම වේගවත් කිරීම.

II මධ්‍යගත මුදල් හුවමාරුවෙන් බැහැරව දෙපාර්තමේන්තුවලට එදිනෙදා ස්වාධීනව මුදල් ලබා ගැනීමේ පහසුකම සලසා දීම තුලින් රජයේ බැංකු ගිණුම් වල ඇති පාවිච්චි නොවූ මුදල් ශේෂ අවම කර ගැනීම.

III මධ්‍යගත ගිණුම මගින් බැංකු ගිණුම් අධීක්ෂණය කිරීමේ හැකියාව භාණ්ඩාගාර මට්ටමින් හා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මට්ටමින් යන දෙඅංශයෙන්ම වැඩිදියුණු කිරීම.

**යෝජිත බැංකු ගිණුම් ජාලය**

යෝජිත ක්‍රමයත් සමඟ භාණ්ඩාගාරයේ පිහිටුවන ලද බැංකු ශාඛාවේ මධ්‍යගතව පාලනය වන බැංකු ගිණුමක්ද (ප්‍රධාන ගිණුම) අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලට අදාල බැංකු ගිණුම් එම ප්‍රධාන ගිණුමේ "උප ගිණුම් " වශයෙන්ද ක්‍රියාත්මක වේ. අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු යටතේ පවතින ශාඛා කාර්යාල වේ නම් එම කාර්යාලවලට අදාල මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ ගිණුම් ඉහත උප ගිණුම්වල දෙවන මට්ටමේ ගිණුම් ලෙසද ක්‍රියාත්මක වේ.

**අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල**

දැනට පවතින ක්‍රමයෙන් නව ක්‍රමයට අවතීර්ණවීම උදෙසා පහත දැක්වෙන ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුව ඇත.

1 දැනට පවත්වාගෙන යන සියළුම බැංකු ගිණුම් වෙනුවට නව බැංකු ගිණුම් ල බාදීම.

(අ) සියළුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු නව බැංකු ගිණුම් ( භාණ්ඩාගාර ගිණුමේ උප ගිණුම්) වෙනුවෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලංකා බැංකුව හා මහජන බැංකුව සම්බන්ධීකරණය කරමින් ක්‍රමික ගිණුම් අංක ල බාදීමට ක්‍රියාකරනු ඇත. ඒ සඳහා මේ සමඟ අමුණා ඇති අංක 1 දරණ ආකෘති පත්‍රය අනුව අයදුම්පත්‍රයක් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත 2007 ඔක්තෝබර් 15 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

(ආ) අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු උප කාර්යාලවල බැංකු ගිණුම් වෙනුවෙන්ද අවශ්‍යතාවය පරිදි ඉහත සඳහන් ක්‍රියා පරිපාටියම අනුගමනය කළ යුතුය. මෙම බැංකු ගිණුම් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල උප ගිණුම් වශයෙන් සලකනු ලැබේ.

(ඇ) නව බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම 2007 නොවැම්බර් 01 දින ආරම් භ විය යුතුය.

2. නව බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීමත් සමඟම රට සමගාමීව පවතින පැරණි බැංකු ගිණුම් සියල්ලම වසා දැමීමට කටයුතු කළ යුතුය.

(1) ගිණුම් වැසීම පිළි බඳ මූලික පියවර.

(අ) බැංකු සැසඳුම් යාවත්කාලීන කිරීම.

ඔ බ ආයතනය යටතේ ඇති සියළු බැංකු ගිණුම්වල බැංකු සැසඳුම් යාවත්කාලීන කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටින අතර එම බැංකු සැසඳුම් වලින් පෙන්වන තොරතුරු අනුව එදිනට බැංකුවට ඉදිරිපත් නොවූ ගෙවීම් චෙක්පත් හා රට පෙර දින බැංකුවේ තැනපත් කළ උප ල බ්ධි නොවූ තැනපත් හැර වෙනත් කිසිදු සටහනක් බැංකු සැසඳුමේ නොපෙන්වන බව තහවුරු කර ගැනීම. මෙම කටයුත්ත 2007 ඔක්තෝබර් මස අවසාන වීමට පෙර සම්පූර්ණ කල යුතුය.

(ආ) මාස 6 ට වඩා කල් ඉකුත් වූ ඉදිරිපත් නොකළ චෙක්පත්

මේ සම් බන්ධව මු.රෙ.396 දැක්වෙන පරිදි 2007 සැප්තැම්බර් මස අවසානයට පෙර සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතුය.

(ඇ) 2007 ඔක්තෝබර් 31 දිනට මුදල් පොතේ ශේෂය

2007 ඔක්තෝබර් 31 දිනට මුදල් පොතේ ශේෂය (බැංකුවේ ශේෂය නොවේ) නව මුදල් පොතේ පළමු සටහන වශයෙන් ඇතුළත් කර නව බැංකු ගිණුමට මාරු කළ යුතුය.

2007 නොවැම්බර් 1 දා සිට එම නව බැංකු ගිණුම් ක්‍රියාත්මක වන අතර 2007 ඔක්තෝබර් 31 දිනට පසුව, නිකුත්කළ චෙක්පත් අවලංගු කිරීම හැර වෙනත් කිසිදු සටහනක් පැරණි බැංකු ගිණුම මගින් සිදු කිරීමට ඉඩ දෙනු නොලැ බේ.

(ඇ) CIGAS ක්‍රමය යටතේ ගිණුම් සටහන් කිරීමේ ක්‍රියා පිළිවෙත.

CIGAS ක්‍රමය යටතේ 2007 ඔක්තෝබර් 31 දිනට හිඟ උප අග්‍රිමයන් පිළි බඳව කටයුතු කළ යුතු ආකාරය මේ සමඟ අමුණා ඇති ඇමුණුම "ඒ" පරිදි සිදු කළ යුතුය.

(ඉ) පැරණි බැංකු ගිණුම යටතේ වූ ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් ක්‍රියාකල යුතු ආකාරය.

2007 දෙසැම්බර් 31 දිනට බැංකුව වෙත ඉදිරිපත් නොකළ සියළුම චෙක්පත් මුදල් පොත හර කරමින් හා ඔබේ තැන්පත් ගිණුමට බැර කරමින් අවලංගු කිරීමට ක්‍රියාකල යුතුය.ඉන් පසුව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමට චෙක්පතක් ලියා ඉහත තැන්පත් ගිණුම හර කරමින් හා මුදල් පොත බැර කරමින් ආකෘති පත්‍ර අංක 2 සහ 3 මගින් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීමට ක්‍රියාකල යුතුය.

එම මුදලින් යම්කිසි මුදලක් ගෙවීම්ලා හියකු විසින් ඉල්ලුම් කරන්නේ නම් එම මුදල් ආපසු ලබා ගැනීම සඳහා මේ සමඟ අමුණා ඇති අංක 4 දරණ ආකෘති පත්‍රය පරිදි ඉල්ලුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

3. පෙර බැංකු ගිණුම් වැසීම

ඉහත 2 පරිදි සියලු ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව අදාල බැංකු ගිණුමේ 2008 ජනවාරි 1 වන විට කිසිම බැංකු ශේෂයක් නොතිබිය යුතුය. ඉන් පසුව බැංකු ගිණුම වැසීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර අංක 5 පරිදි අයදුම්පතක් පිළියෙල කර භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත 2008 ජනවාරි මස අවසානයට පෙර ඉදිරිපත් කළ යුතුය.

4. අක්‍රීය බැංකු ගිණුම් වසා දැමීම.

අක්‍රීය බැංකු ගිණුම් සියල්ලම වහාම වසා දැමීමට ක්‍රියා කළ යුතු අතර ඒ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් 2007 ඔක්තෝබර් 31 දින වන විට මේ සමඟ අමුණා ඇති පෝරම අංක 5 පරිදි පිළියෙල කර භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය.

5. මේ සම් බන්ධව වැඩිදුර තොරතුරු /උපදෙස් ල බාගැනීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පහත නම් සඳහන් නිලධාරීන් අමතන්න.

(අ) පද්මා සේනාධිපති මහත්මිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - දුරකතන අංක- 011-2484738

(ආ) එම්.එස්.ඩී.රණසිරි මහතා -
අධ්‍යක්ෂ (මුදල් කළමනාකරණ) - දුරකතන අංක-011-2484753

පී. බී.ජයසුන්දර
ලේකම්
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

පිටපත්:-
1. විගණකාධිපති
2. සාමාන්‍යාධිකාරී-ලංකා බැංකුව/මහජන බැංකුව
3. ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්) ..........................................

à`´|ù|È :-

| | |
|---|---|
| à$æ#õ ûõ - 1- | නිල බැංකු ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා වූ ආකෘති පත්‍රය |
| à$æ#õ ûõ - 2- | මාස 6 ට වැඩි බැංකුව වෙත ඉදිරිපත් නොකල අවලංගු කරන ලද චෙක්පත් පිළිබඳ ලැයිස්තුව |
| à$æ#õ ûõ - 3- | මාස 6 ට අඩු බැංකුව වෙත ඉදිරිපත් නොකල අවලංගු කරන ලද චෙක්පත් පිළිබඳ ලැයිස්තුව |
| à$æ#õ ûõ - 4- | භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අවලංගු කරන ලද චෙක්පත් වෙනුවෙන් මුදල් නැවත ඉල්ලීම |
| à$æ#õ ûõ - 5- | නිල බැංකු ගිණුම් වැසීම සඳහා අදාල ආකෘති පත්‍රය |
| ඇමුණුම ඒ - | නව බැංකු ගිණුමක වාර්තා පවත්වාගෙන යාම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් CIGAS ගිණුම් දත්ත වල සිදුකළ යුතු වෙනස්කම් |

(ආකෘති පත්‍ර අංක :- 1)

*(රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 105/98, ආකෘති පත්‍ර : එස්ඒ/ බීඒ/ 01)*

## නිල බැංකු ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා වූ ආකෘති පත්‍රය

(1) වැය ශීර්ෂය :- ____________________

(2) අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :-____________________

(අ) උප කාර්යාලය :-____________________

(3) දෙපාර්තමේන්තුවක් නම් අදාල අමාත්‍යාංශය :- ____________________

____________________

*(4)* බැංකු ගිණුම විවෘත කිරීමේ අවශ්‍යතාවය :- *භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 05/2007 හි 1 පරිදි*

(5) බැංකු ගිණුමේ නම :- (බැංකු ගිණුමේ කාර්යය සංක්ෂිප්තව සංකේතවත් විය යුතුය)

____________________

____________________

(6) දැනට ක්‍රියාත්මක වන බැංකු ගිණුමක් මෙම කාර්යය සඳහා යොදා ගත නොහැකි මන්ද? එසේනම් එයට හේතු දක්වන්න

*නව බැංකු ගිණුම් ක්‍රමයක් හඳුන්වා දීම හේතුවෙන්*

(7) බැංකු ගිණුම් විවෘත කිරීමට අදහස් කරන්නේ දැනට ක්‍රියාත්මක වන බැංකු ගිණුමක් වැසීමට කටයුතු කිරීමෙන් නම් එම බැංකු ගිණුම් පිළිබඳ විස්තර

(I) බැංකුව :-____________________

(II) බැංකු ශාඛාව :-____________________

(III) බැංකු ගිණුම් අංකය :-____________________

(IV) ගිණුමේ නම :-____________________

(V) ____________ දිනට ශේෂය ____________________

(VI) අවසාන වරට බැංකු සැසඳුම් කළ මාසය :-____________________

(VII) මුදල් නොවූ චෙක්පත්වල වටිනාකම :-____________________

(VIII) දැනට පවතින බැංකු ගිණුම් වැසීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද?

____________________

____________________

(8) (i) බැංකු ගිණුම සඳහා මුදල් ලැබෙන්නේ ඒකාබද්ධ අරමුදලින්ද? විදේශාධාර මුදල් වලින්ද?

______________________________________________

(ii) විදේශාධාර මුදලින් නම් ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන පිළිබඳ විස්තර :-

වැය විස්තරය :- ______________________________________

ඇස්තමේන්තු මුදල රු. :- ______________________________

(9) ගිණුම විවෘත කිරීමට අදහස් කරන බැංකුව හා බැංකු ශාඛාව :- ______________

______________________________________________

(10) බැංකු ගිණුම මෙහෙයවීමට යෝජනා කරන නිලධාරීන්ගේ විස්තර :-

| | නිලධාරියාගේ නම | තනතුර | වාර්ෂික වැටුප | මු.රෙ. 880 යටතේ ඇප තබා ඇත්ද යන වග |
|---|---|---|---|---|
| 1. | __________ | ________ | ________ | ________ |
| 2. | __________ | ________ | ________ | ________ |
| 3. | __________ | ________ | ________ | ________ |
| 4. | __________ | ________ | ________ | ________ |

(11) ලේකම් ______________________________________

ඉහත සඳහන් විස්තර නිවැරදිය. නව බැංකු ගිණුම විවෘත කිරීමට අදාල ලියකියවිලි මේ සමඟ ඉදිරිපත් කරමි. ඒවා ඔබගේ නිර්දේශය සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන්නේනම් මැනවි.

දිනය :- ______________________

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ප්‍රධාන ගණකාධිකාරීගේ
අත්සන (නිල මුද්‍රාව)

(12) භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්

ඉහත විස්තර සඳහන් බැංකු ගිණුම විවෘත කිරීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :-

අමාත්‍යාංශයේ ලේකම්
(ප්‍රධාන ගණන් දීමේ නිලධාරී) ගේ අත්සන
(නිල මුද්‍රාව)

(13) පහත සඳහන් ලියවිලි මෙයට අමුණා ඇත.

(I) ගිණුම විවෘත කිරීමේ අවශ්‍යතාවය තහවුරු කිරීමට අදාල ලියවිලි වල පිටපත්,

(II) අදාල බැංකුවෙන් ලබාගත් නිවැරදිව සම්පූර්ණ කරන ලද මැන්ඩේට් පත්‍රය,
(මෙය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කල යුතු වේ.)

(III) ගිණුම මෙහෙයවීමට යෝජනා කරන නිලධාරීන්ගේ ආදර්ශ අත්සන් ඇතුළත් අත්සන් කාඩ්පත්

- එක් අයෙකු සඳහා අත්සන් කාඩ්පත් 02 බැගින් ඉදිරිපත් කළ යුතු වේ
- මෙම ආදර්ශ අත්සන් පහත දැක්වෙන ලෙස සහතික කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ ලේකම්ගේ ආදර්ශ අත්සන | - | අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් සහතික කොට නිල මුද්‍රාව තැබිය යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ ආදර්ශ අත්සන | - | අමාත්‍යාංශ ලේකම් විසින් පෞද්ගලිකවම සහතික කොට නිල මුද්‍රාව තැබිය යුතුය. |
| (ඇ) | අනෙකුත් නිලධාරීන්ගේ ආදර්ශ අත්සන | - | දෙපාර්තමේන්තු ප්‍රධානියා පෞද්ගලිකවම සහතික කොට නිල මුද්‍රාව තැබිය යුතුය. |

(IV) අමාත්‍යාංශයේ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනස් වූ විට ඒ වෙනුවට පත්කරනු ලබන නිලධාරියා සඳහා පත්වීම් ලිපියේ පිටපතක්.

(ආකෘති පත්‍ර අංක :- 2)

අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**<u>මාස 6 ට වැඩි බැංකුව වෙත ඉදිරිපත් නොකල අවලංගු කරන ලද චෙක්පත් පිළිබඳ ලැයිස්තුව</u>**

*(චක්‍ර ලේඛයේ 2.(1) (ඉ) පරිදි)*

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :- ______________________________

________________________________________________________________________

බැංකුව සහ බැංකු ශාඛාව :-____________________________________________________

බැංකු ගිණුම් අංකය :- _________________________________________________________

| නිකුත් කල දිනය | චෙක්පත් අංකය | චෙක්පත් ලාභියාගේ නම | මුදල |
|---|---|---|---|
| | | | |

එකතුව ___________________

භාණ්ඩාගාරය වෙත එවන
චෙක්පත් අංකය සහ දිනය :-________________________ __________________________

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවට සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ අත්සන:- ___________________________________________________

සහතික කරන නිලධාරියාගේ නම :- _____________________________________________________

තනතුර :-___________________________________________________________________

දිනය :- ______________________________

** එක් එක් බැංකු ගිණුම් සඳහා වෙන වෙනම ලැයිස්තු ඉදිරිපත් කල යුතුය*

(ආකෘති පත්‍ර අංක :- 3)

අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

<u>මාස 6 ට අඩු බැංකුව වෙත ඉදිරිපත් නොකල අවලංගු කරන ලද චෙක්පත් පිළිබඳ ලැයිස්තුව</u>
*(චක්‍ර ලේඛයේ 2.(1) (ඉ) පරිදි)*

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :- ____________________________

______________________________________________________________________

බැංකුව සහ බැංකු ශාඛාව :-________________________________________________

බැංකු ගිණුම් අංකය :- ____________________________________________________

| නිකුත් කල දිනය | චෙක්පත් අංකය | චෙක්පත් ලාභියාගේ නම | මුදල |
|---|---|---|---|
| | | | |

එකතුව ________________

භාණ්ඩාගාරය වෙත එවන
චෙක්පත් අංකය සහ දිනය :-________________________ ________________________

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවට සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ අත්සන:- ________________________________________

සහතික කරන නිලධාරියාගේ නම :- __________________________________________

තනතුර :-__________________________________________________________

දිනය :- ____________________________

** එක් එක් බැංකු ගිණුම් සඳහා වෙන වෙනම ලැයිස්තු ඉදිරිපත් කල යුතුය*

(ආකෘති පත්‍ර අංක :- 4)

මගේ අංකය:- ____________________

අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අවලංගු කරන ලද චෙක්පත් වෙනුවෙන් මුදල් නැවත ඉල්ලීම**

1. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :-__________________
______________________________________________________________________

2. භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කල මුළු මුදල :- ___________________________________

3. චෙක්පත් අංකය සහ දිනය :- ______________________________ ____________________

4. අවලංගු වූ චෙක්පත්වල විස්තර :-

| ගෙවන්නාගේ නම | චෙක්පත් අංකය | දිනය | මුදල | අවලංගු කල දිනය |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |

5. ඉහත සඳහන් විස්තර නිවැරදි බවට සහතික කරමි. එම ඉල්ලීම් වලට අදාල ලිපි වල ඡායා පිටපත්ද මේ සමඟ ඉදිරිපත් කරමි.

______________________________
සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ නම :- __________________________________________

තනතුර :-________________________________________________________________

දිනය :- ______________________________

(ආකෘති පත්‍ර අංක :- 5)

*(රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 105/98, ආකෘති පත්‍ර : එස්ඒ./ බීඒ/ 03)*

<u>නිල බැංකු ගිණුම් වැසීම සඳහා අදාල ආකෘති පත්‍රය</u>

(1) වැය ශීර්ෂය :- ______________________________

(2) අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :- ______________________________

උප කාර්යාලය :- ______________________________

(3) දෙපාර්තමේන්තුවක් නම් අදාල අමාත්‍යාංශය :- ______________________________

(4) බැංකු ගිණුමේ නම :- ______________________________

(5) බැංකු ගිණුම් අංකය :- ______________________________

(6) බැංකුව හා ශාඛාව :-______________________________

*(7)* බැංකු ගිණුම වැසීමට හේතු :- *<u>භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 5/2007 හි 3 පරිදි</u>*

(8) අවසාන වරට බැංකු ගිණුම ක්‍රියාත්මක වූ වර්ෂය හා මාසය :- ______________________

(9) ගිණුමේ මුදල් නොවූ චෙක්පත් පිළිබඳව මු.රෙ. 396 යටතේ ගෙන ඇති ක්‍රියාමාර්ගය :-

______________________________________________________________

______________________________________________________________

(10) භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්,

පහත සඳහන් ලියවිලිද මේ සමඟ ඉදිරිපත් කරමි. මේ අනුව උක්ත බැංකු ගිණුම වැසීමට පියවර ගන්නා ලෙස ඉල්ලමි.

දිනය:- ____________ ________________________

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

(11) පහත සඳහන් ලියවිලි මෙයට අමුණා ඇත.

1. ගිණුම ක්‍රියාත්මක වූ අවසාන මාසයට අදාල බැංකු ප්‍රකාශයේ පිටපතක්
2. දැනට බැංකු ගිණුමේ පවතින ශේෂය පිළිබඳ බැංකුවෙන් ලබා ගත් ශේෂ සහතිකයක්
3. අවසන් වරට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශයේ පිටපතක්

   (මුදල් පොතේ සියළු ගැලපීම් සිදු කිරීමෙන් පසුව)

ඇමුණුම ඒ

*(චක්‍රලේඛයේ 2(1) (ඈ) පරිදි)*

## <u>නව  බැංකු ගිණුමක වාර්තා පවත්වාගෙන යාම සඳහා අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් CIGAS ගිණුම් දත්තවල සිදුකළ යුතු වෙනස්කම්</u>

මෙම චක්‍රලේඛයේ ප්‍රතිඵලයක් ලෙස ඔ  බ විසින් අළුතින් විවෘත කරනු ල  බන බැංකු ගිණුම CIGAS ගිණුම් මෘදුකාංගයේද විවෘත කළ යුතු වේ.

ඒ සඳහා CIGAS ප්‍රධාන මෙනුවේ පහත සඳහන් පියවරයන් අනුගමනය කරන්න.

5. Utility ⟶ 4 Opening Balances

එවිට CIGAS වැඩ සටහන පරිගණකයෙන් ඉවත්වන අතර ඔ  බ නැවත CIGAS වැඩ සටහනට ගිය විට ආරම්  භක ශේෂ මෙනුවට යා හැක. එහි

1. Bank Account ⟶ 1. Enter

වරණයන් තෝරා "BC" හෝ "BC 2" යනාදී ලෙස උපරිම අකුරු හෝ ඉලක්කම් තුනකින් සමන්විත වන දැනටමත් භාවිතා නොකරන බැංකු සංකේතයක් ඇතුළත් කරන්න. ඉන් අනතුරුව ඊට පහලින් ඇති ස්ථානයන්හි බැංකු වර්ගය, බැංකු ශාඛාවේ නම, බැංකු අංකය,ශාඛා අංකය හා  බැංකු ගිණුම් අංකය ඇතුළත් කර ගන්න.

මෙහිදී විවෘත කරනු ල  බන බැංකු ගිණුම අළුත්ම බැංකු ගිණුමක් වන බවත් පැරණි බැංකු සංකේතය යටතේ ති  බූ පහත සඳහන් දත්ත මෙම නව  බැංකු සංකේතය යටතේ දක්නට නොලැ  බෙන බවත් සටහන් කර ගන්න.

නොපියවූ අතුරු අග්‍රිම ශේෂයන්
නොපියවූ තැන්පතු කේවල ශේෂයන්
ගෙවන ලද තැන්පතු කේවල ශේෂ
ගෙවීම්
ලැ  බීම්
උපල  බ්ධි නොවූ ගෙවීම්
උ  පලබ්ධි නොවූ ලැ  බීම්
උ  පලබ්ධි වූ ගෙවීම්
උපල  බ්ධි වූ ලැ  බීම්
ඉවත් කරන ලද උපල  බ්ධි නොවූ ගෙවීම්
ඉවත් කරන ලද උ  පලබ්ධි නොවූ ලැ  බීම්
ඉවත් කරන ලද හඳුනානොගත් ගෙවීම්
ඉවත් කරන ලද හඳුනානොගත් ලැ  බීම්

ඉහත දක්වන ලද පැරණි  බැංකු සංකේතය යටතේ දක්නට ලැබූ කුමන හෝ ශේෂයක් නව බැංකු සංකේතය යටතේද පවත්වාගෙන යාමට අවශ්‍ය නම් ඒවා ඉවත් කර නව  බැංකු සංකේතය යටතේ එකින් එක ඇතුලත් කර ගත යුතු වේ.  මෙහිදී සාමාන්‍යයෙන් නොපියවූ අතුරු අග්‍රිම හා නොගෙවන ලද තැන්පතු කේවල ශේෂ පමණක් මෙසේ ඇතුළත් කිරීම සිදුකල යුතු අතර අනෙක් දත්ත  බැංකු සංකේතයටම විශේෂිත වන නිසා පැරණි බැංකු සංකේතය යටතේ තිබෙන දත්ත ඉවත් නොකර වුවද නව බැංකු සංකේතය යටතේ ඇතුළත් කිරීම ප්‍රමාණවත් වේ.

අත්මුදල් ගිණුම් අංකය වෙනස් නොකර පැරණි ලෙසම පවත්වාගෙන යන්න.

**භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්තුමා වෙත චෙක්පත එවීම.**

(මේ සඳහා පැරණි  බැංකු සංකේතය භාවිතා කරන්න)

චක්‍රලේඛයේ 2.1 e ඡේදයේ දැක්වෙන පරිදි උපල  බ්ධි නොවූ චෙක්පත් CIGAS වැඩසටහනේ "C" කාණ්ඩය යටතේ තැන්පතු ලැ  බීම් ලෙස ගැලපෙන පරිදි රිසිට්පත් අංක ද ඇතුළත් කර මුදල් පොතට ලැ  බීමක් ලෙස එකින් එක ඇතුළත් කර ගන්න.

ඔ  බ විසින් ඉහත ඇතුළත් කරන ලද තැන්පතු සියල්ලම එක් චෙක්පතක් පමණක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්තුමා වෙත එවිය යුතු බැවින් අදාල තැන්පතු කේවල ශේෂයන් CIGAS වැඩසටහනේ

2. Ledger → 5. Deposit Details → 3. Add Together

යන වරණයන් යටතේ එකතු කර එක් අංකයක් යටතේ එක් තැන්පතු ශේෂයක් ඇතිකර ගන්න. එසේ එකතු කරන ලද කේවල ශේෂ අඩංගු වාර්තාවක්

2. Ledger → 5. Deposit Details → 4. History

යන පියවරයන්  භාවිතා කර අනාගත අවශ්‍යතා සඳහා මුද්‍රණය කර තබාගන්න.

ඉන්  පසුව එකතු කරන ලද තැන්පතුව " D " කාණ්ඩය යටතේ තැන්පත් ගෙවීමක් ලෙස CIGAS වැඩසටහනට ඇතුලත් කර  භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් නමින් චෙක්පතක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන්න.

උපල  බ්ධි නොවූ චෙක්පත් ලැයිස්තුවල ඇති ආරම්  භයේ තිබූ ගෙවීම් සියල්ලම හා තැන්පතු ගිණුමට මාරුකල ලැ  බීම් සියල්ල කිසිදා උපල  බ්ධි නොවන  බැවින් මාසික ගිණුම් වැසීමේ ක්‍රියාවලිය නිම කළ පසු

5. Utility → 5. Unrealized Cheques

වරණය තෝරා ඉවත් කිරීමට කටයුතු කරන්න.